# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2449/12 – 2025 අගෝස්තු මස 12 වැනි අඟහරුවාදා – 2025.08.12**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2025 මහියංගණ ඇසළ උත්සවය

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති 1948 සැප්තැම්බර් 10 දාතම අංක 9902 *ගැසට් පත්‍රයේ* ද, 1951 අගෝස්තු 17 දාතම අංක 10283 *ගැසට් පත්‍රයේ* ද, 1955 මාර්තු 25 දාතම අංක 14,778 *ගැසට් පත්‍රයේ* ද, 1967 ජුනි 09 දාතම අංක 14752 *ගැසට් පත්‍රයේ* ද පළවූ මහියංගණ වන්දනා ගමන් පිළිබඳ ව්‍යවස්ථාව ද, 1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව ද, මහියංගණ ප්‍රාදේශීය ලේකම්/කඳවුරුභාර නිලධාරී වික්‍රමනායක විමංස සෙනෙවිරත්න වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2025 මහියංගණ ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග පනවමි.

01. 2025 අගෝස්තු මස 25 වැනි දින කප් සිටුවීමෙන් මහියංගණය ඇසළ උත්සවය ආරම්භ වී, 2025 සැප්තැම්බර් මස 08 වැනි දින දිය කැපීමෙන් පසු අවසන් වන බව දැනුම් දෙමි.

02. මහියංගණ - බිබිල මහා මාර්ගයේ කි.මී. 37 කණුව සිට මහියංගණ ජාතික පාසල ඉදිරිපිට පිහිටි 2/39 බෝක්කුව දක්වා ද, විල්ලුව වැව පාර ආරම්භක කොටස ද, මහියංගණ රෝහල ඉදිරිපිට ඔරලෝසු කණුව අසළට වැටෙන ගහවට වීදිය, අංමැඩිල්ල වීදිය සහ දේවාල වීදිය යන මායිම්වලට මැදිව පිහිටි භූමි භාගය වන්දනාකරුවන්ට ලැඟුම් සඳහා වූ කඳවුරු භූමිය වශයෙන් නම් කරමි.

03. චෛත්‍ය මළුව, බෝමළුව, දේවාල භූමිය යන ස්ථානයන් හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම සහ වෙළඳාම් කටයුතු තහනම් කරමි.

04. මැද වීදියෙහි චෛත්‍යයට මුහුණලා ඇති බිම් තීරුවෙහි හා මකර තොරණට වම් පසින් පිහිටි බිම් තීරුවෙහි ප්‍රාදේශීය ලේකම්/කඳවුරුභාර නිලධාරි විසින් නිකුත් කරන ලද බලපත්‍ර මත මල්, සුවඳ කූරු, ඉටිපන්දම්, කපුරු, භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රූප සහ පූජා භාණ්ඩ විකිණීම සඳහා අවසර දෙමි.


1A – G 045094 – 14 (2025/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. ඉහත භාණ්ඩ වෙළඳාම් කිරීම සඳහා රජමහා විහාරය සහ සමන් දේවාලය විසින් ඉදිකර ඇති ස්ථිර කඩ කාමර 60 තුළ හැර ඉතිරි කොටසේ චෛත්‍යයට මුහුණලා ඇති බිම් තීරුවෙන් ඔබ්බට ද මෙයින් අවසර දෙමි.

06. මෙකී ඉහත දෙවන වගන්තියේ සඳහන් කඳවුරු භූමියේ ප්‍රාදේශීය ලේකම්ගෙන්/කඳවුරුභාර නිලධාරිගෙන් ලබාගත් බලපත්‍ර පිට සාදන ලද තාවකාලික ගොඩනැගිලිවල හා දැනට ඉදිකර ඇති ස්ථිර ගොඩනැගිලි 60 හි වන්දනාකරුවන්ට කෑම බීම බෙදාදීම සඳහා හෝ විකිණීම සඳහා ද වෙනත් වෙළඳ භාණ්ඩ විකිණීම සඳහා ද අවසර දෙමි.

07. බස්නායක නිලමේතුමා සහ විහාරාධිපති හිමියන් විසින් දැන්වීමකින් ප්‍රසිද්ධ කර ඇති පෙරහැර ගමන් මාර්ගයේ දුටුගැමුණු වීදිය, මැද මාවත, අම්මැඩිල්ල පාර, බදුල්ල-මහියංගණ ප්‍රධාන පාර, බෝධිමළුව මාවත, සංඝාවාසය ඉදිරිපිට පාර යන මාර්ගවල දෙපස ඇති වතුර බැස යන කාණුවේ සිට අඩි 10 ක් ඔබ්බෙන් පිහිටි ප්‍රදේශය වෙළඳාම් කටයුතු සඳහා වෙන් කරමි.

08. රෝහල ඉදිරිපිට ඔරලෝසු කණුවේ සිට බදුල්ල ප්‍රධාන මාර්ගයේ මකර තොරණ දක්වා දෙපස හා ස්ථිර වෙළඳසැල් ඉදිරිපිට වෙළඳාම් කිරීම තහනම් කරමි.

09. ඉහත අංක 04, 05, 06 යන වගන්තිවලින් නියම කර ඇති පරිදි හැර, කඳවුරු භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක තාවකාලික වෙළඳ කුටි ඉදිකිරීම හා ජංගම වෙළඳ කුටි මඟින් වෙළඳාම් කිරීම හා ගඟවට පාර දෙපස දැනට ඉදිකර ඇති වෙළඳ කුටි හැර වෙනත් තාවකාලික වෙළඳ කුටි ඉදිකිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

10. ප්‍රධාන මාර්ගයේ  පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි.

11. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථවාහන ප්‍රාදේශීය ලේකම්/කඳවුරුභාර නිලධාරි තැනගේ හෝ ඔහු විසින් බලය පැවරූ වෙනත් නිලධාරියෙකුගේ බලපත්‍රයක් නොමැතිව කඳවුරු භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

12. මහියංගණ - බිබිල මාර්ගයට මුහුණලා ඉදිකර ඇති වාහල්කඩ අසළින් පූජාභූමියට ඇතුළුවන ප්‍රධාන පිවිසුම් මාර්ගය, විල්ලුව වැව පාර, මකර තොරණ අසළින් පූජා භූමියට ඇතුළුවීමට ඇති පිවිසුම් මාර්ගය, රෝහල ඉදිරිපිට ඇති ඔරලෝසු කණුව අසළින් ඇති මාර්ගය සහ මහියංගණ ජාතික පාසල ඉදිරිපිට ඇති 2/39 බෝක්කුව අසළින් ඇති මාර්ගවලින් කඳවුරු භූමිය තුළට අවසර පත්‍රයක් රහිතව කිසිම වාහනයක් ඇතුළු කිරීම තහනම් කරමි.

13. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදුදෙන ආකාරය දැන්වීම මඟින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

14. බද්දට ගන්නා ලද වෙළඳ බිම්වල ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි මහියංගණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ උපදෙස්වලට අනුකූල විය යුතුය.

15. මා විසින් නියම කරනු ලැබුවහොත් සෑම වෙළඳසැලක් අසළම තාවකාලික වැසිකිළි 01 ක් හෝ 02 ක් ඉදිකළ යුතුය.

16. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තමන්ගේ තාවකාලික ගොඩනැගිලි ඉවත්කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතින් ඇතුළු සියලුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.

17. මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම් කරමි.

18. කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම්ගෙන්/කඳවුරුභාර නිලධාරිගෙන් අවසර ලබාගෙන මිස, වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කර තබන්නාවූ හෝ යම් බිමක් හෝ කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුරු මෙන් සෑදී තිබෙන්නාවූ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ විශාල කිරීම නොකළ යුතුය.

19. පෙරහැර නැරඹීම සඳහා මුදල් අයකර ආසන සැපයීම සපුරා තහනම් කරමි.

20. බදුල්ල-මහියංගණ ප්‍රධාන මාර්ගයේ කලාප අධ්‍යාපන කාර්යාලය අසළ සිට නව කොවිඩ් රසායානාගාර ඒකකය දක්වා වූ කොටසේ තාවකාලික වෙළඳ කුටි ඉදිකිරීම තහනම් කරමි.

21. රථ වාහන ගාල් කරන ස්ථාන:-

    1. පූජා භූමියට නම් කර ඇති රථ ගාල (රෝහල ඉදිරිපිට ඇති බිම් කොටස)

    2. සිරිසඟබෝ පෙර පාසල සහ මකර තොරණට වම් පස බිම් කොටස සිට බෝ මළුව වීදිය දක්වා බිම් කොටස

    3. විල්ලුව වැව මාර්ගය හා මහියංගණ - බිබිල මාර්ගයට මැදිව ඇති ත්‍රිකෝණාකාර බිම් කොටස මගී ප්‍රවාහන බස් රථ ගාල් කිරීම සඳහා

22. ගඟවට වීදියේ මහවැලි ගං ඉවුර ආශ්‍රිතව පෙරහැරේ යන අලි ඇතුන් දිවා හෝ රාත්‍රී කාලයේදී බැඳ ගාල් කර තැබීම තහනම් කරමි.

## 15 ව්‍යවස්ථාව

(අ) රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

(ආ) ප්‍රාදේශීය ලේකම්ගේ, බලයලත් නිලධාරිගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය.

**ඩබ්. විමංස සෙනෙවිරත්න,**
ප්‍රාදේශීය ලේකම්, මහියංගණය.

## 2025 මහියංගණ ඇසළ උත්සවය

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති 1948 සැප්තැම්බර් 10 දාතම අංක 9902 *ගැසට් පත්‍රයේ* ද, 1951 අගෝස්තු 17 දාතම අංක 10283 *ගැසට් පත්‍රයේ* ද, 1955 මාර්තු 25 දාතම අංක 14,778 *ගැසට් පත්‍රයේ* ද, 1967 ජූනි 09 දාතම අංක 14752 *ගැසට් පත්‍රයේ* ද පළවූ මහියංගණ වන්දනා ගමන් පිළිබඳ ව්‍යවස්ථාව ද, 1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව ද, මහියංගණ ප්‍රාදේශීය ලේකම්/කඳවුරුභාර නිලධාරී වික්‍රමනායක විමංස සෙනෙවිරත්න වන මා වෙත පැවරී ඇති බලතල අනුව මෙහි පහත සඳහන් ස්ථාන වන්දනාකරුවන්ට කෑම බීම බෙදාදීම සඳහා හෝ විකිණීම සඳහා වෙන් කරමි.

(අ) මහියංගණ-බිබිල මාර්ගයේ කි.මී. 37 සිට ජාතික පාසල ඉදිරිපිට ඇති 2/39 බෝක්කුව දක්වා ඇති ස්ථිර ගොඩනැගිලි.

(ආ) කඳවුරු ප්‍රදේශයේ වන්දනාකරුවන් සඳහා ලැගුම් පිණිස වෙන් කර ඇති පිට්ටනියේ මාගෙන් ලබාගත් බලපත්‍රයක් මත සාදන ලද තාවකාලික ගොඩනැගිලි.

ඉහත සඳහන් ස්ථාන හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත අන්කිසි මොනයම් ස්ථානයක හෝ බිමක් මේ සඳහා තහනම් වේ.

**ඩබ්. විමංස සෙනෙවිරත්න,**
ප්‍රාදේශීය ලේකම්, මහියංගණය.

2025 අගෝස්තු මස 05 වැනි දින,
මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 – 0100

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.